## අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

### 1. <u>අධ්‍යක්ෂ (රැකවරණ) HM 1-3 (තනතුරු 01)</u>

1.1 **රැකියා ස්වභාවය :**

පනතේ (VI) වන කොටස ප්‍රකාරව අපරාධයක වින්දිතයෙකුට සහ සාක්ෂිකරුවෙකුට ආරක්ෂාව සැපයීමට අදාළ රාජකාරී පැවරෙන අතර රැකවරණ අංශයේ ප්‍රධානියා ලෙස රාජකාරී වගකීම් හා කාර්යයන් ඉටු කිරීම මෙම තනතුරේ වගකීම් යටතට ගැනේ.

1.2. **අධ්‍යාපන සුදුසුකම් :**

1.2.1. **බාහිර අයදුම්කරුවන් සඳහා**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, අපරාධ විද්‍යාව හෝ සමාජ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්හි විශේෂ උපාධියක් ලබා තිබීම

**සමඟ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් ලබා තිබීම

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක අදාළ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "විධායක/මධ්‍යම කළමනාකරණ මට්ටමේ" විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරු වල අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

**සමඟ**

ශ්‍රී ලංකා පොලිස් සේවයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම

### 1.2.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

මෙම තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සේවා (MM) ගණයෙහි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

### 1.3. වයස් සීමාව :

අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 1.4. වැටුප් පරිමාණය :

HM 1-3 රු. 86,865-15x2,270 – රු. 120,915

## 2. නීති නිලධාරි JM 1-1 (තනතුරු 02)

### 2.1. රැකියා ස්වභාවය :

අධිකාරියේ නීතිමය කටයුතු සම්බන්ධයෙන් ඉහළ නිලධාරීන්ට සහාය වීම. නීති පර්යේෂණ සිදු කරමින් ඉහළ නිලධාරීන්ට සහාය වීම. කොන්ත්‍රාත්තු සහ අනෙකුත් නීති ලියවිලි කෙටුම්පත් කිරීම, විමර්ශන නිලධාරීගේ වාර්තා පිළිබඳ මූලික අධ්‍යයනයන් සිදු කිරීම සහ එම වාර්තා ඉහළ කළමනාකරණයට ඉදිරිපත් කිරීම

### 2.2. අධ්‍යාපන සුදුසුකම් :

#### 2.2.1. බාහිර අයදුම්කරුවන් සඳහා

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම

සහ

නීතිඥ වෘත්තියේ අවම වශයෙන් වසර එකක (01) පලපුරුද්දක් ලබා තිබීම.

#### 2.2.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

මෙම තනතුරට අදාළ බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම,

හෝ

කළමනාකරණ සහකාර -තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම

### 2.3.වයස් සීමාව :

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

2.4. වැටුප් පරිමාණය : JM 1-1

රු.42,600-10x755-18x1,135 - රු. 70,850

## 3 <u>රැකවරණ නිලධාරි MA 4 (තනතුරු 03)</u>

### 3.1 රැකියා ස්වභාවය :

කළමනාකරණ මණ්ඩලයේ මඟපෙන්වීම යටතේ හා නීති සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශයේ ජොෂ්ඨ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ආයතනයේ නිශ්චිත ක්‍රියා පටිපාටීන් යටතේ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම

### 3.2 අධ්‍යාපන සුදුසුකම් :

3.2.1. බාහිර අයදුම්කරුවන්

(අ) නීතිය/අපරාධ විද්‍යාව/මනෝවිද්‍යාව විෂයක් ලෙස ඇතුලත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් පරීක්ෂක ධූරයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම.

3.2.2. අභ්‍යන්තර අයදුම්කරුවන්

මෙම තනතුර සඳහා වන බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

### 3.3. වයස් සීමාව :

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 3.4. වැටුප් පරිමාණය :

MA 4: රු.37,970-10x755-15x930-5x1135-65,145

## 4. <u>විමර්ශන නිලධාරි MA 4 (තනතුරු 01)</u>

### 4.1.රැකියා ස්වභාවය :

නීති සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශයේ ජොෂ්ඨ කළමනාකරුවන්ගේ අධීක්ෂණය යටතේ විමර්ශනය හා පරීක්ෂණ පැවැත්වීම සහ ජොෂ්ඨ කළමනාකරණයට වාර්තා ඉදිරිපත් කිරීම, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් කඩවීම පිළිබඳ සිද්ධීන් සම්බන්ධ පොලිස් ස්ථාන, දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය

4.2. අධ්‍යාපන සුදුසුකම් :

4.2.1.බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ නීතිය හෝ අපරාධ විද්‍යාව (Criminology) විෂයක් ලෙස ඇතුළත්ව උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් පරීක්ෂක ධූරයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම.

4.2.2. අභ්‍යන්තර අයදුම්කරුවන්

මෙම තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

4.3.වයස් සීමාව :

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4.4.වැටුප් පරිමාණය MA 4 :

රු.37,970-10x755-15x930-5x1135-65,145

## 5. රැකවරණ නිවාස භාරකරු - MA 1-1 (කොන්ත්‍රාත් පදනම)(තනතුරු 01)

### 5.1. රැකියා සාරාංශය :

මෙම අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලබන රැකවරණ නිවසේ භාරකරු වශයෙන් කටයුතු කිරීම, ඒ අනුව නිවාසයේ බඩුබාහිරාදිය නිසි පරිදි භාරව කටයුතු කිරීම, එදිනෙදා ආහාරපාන සැපයීම ආදී කටයුතු කළමනාකරණය කිරීම සහ අධිකාරියේ උපදෙස් පරිදි අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

### 5.2. අධ්‍යාපන සුදුසුකම් :

(අ). අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

### 5.3.පළපුරුද්ද :

(අ). රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ අදාළ රාජ්‍ය නොවන ආයතනයක ආරක්ෂක නිවාසයක සේවය කර තිබීම අතිරේක පළපුරුද්දක් ලෙස සැළකේ.

**5.4.** **වෙනත් සුදුසුකම් :**

(අ). දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

(ආ). කොළඹ, කළුතර, ගාල්ල, ගම්පහ දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.

**5.5.** **වයස් සීමාව :**
අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
**5.6.වැටුප් පරිමාණය :**

රු.27910-10x300-7x350-4x495-20x660-48540

**බඳවා ගැනීම් ක්‍රමවේදය**

**1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සුදුසුකම් ලැබූවන් අතුරින් අවම වශයෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරාගැනීම් සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත පරිදි වේ :

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| අනෙකුත් අදාළ කාර්යය සාධනයන් හා කුසලතා | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය | - | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | - | ලකුණු 100 |

**පොදු කොන්දේසි**

**2. සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

- ✓ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- ✓ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- ✓ විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

3. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම් කළ යුතු අතර ඔහු හෝ ඇය තනතුර සඳහා තෝරාගතහොත් නිදහස් කරන බවට ආයතන ප්‍රධානියා විසින් අයදුම්පතේ සඳහන් කළ යුතුය.

4. දැන්වීමට අනුව මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

5. ඉහත සුදුසුකම් හා තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත්වල ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතුය.

6. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ඔබ දායක වනු ඇත.

7. අනු අංක 01 යටතේ දක්වා ඇති තනතුරු සඳහා රජයේ අනුමත දීමනා සහ තනතුරට හිමි වරප්‍රසාද හිමි වේ.
8. අයදුම්කරුවන් විසින් අනිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.
9. අයදුම්පත් කැඳවීම අවසන් දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
10. සියලු බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කිරිමේදී කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 හි උපලේඛන II පරිදි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුළත් ජීව දත්ත සටහනක් ද සමඟ, “අධ්‍යක්ෂ ජනරාල්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය, 428/11 ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල” යන ලිපිනයට 2023.09.18 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,**
**428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**දු. අංක. 0112879539**
**දිනය 2023.08.27**